2

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79
ආයතනයේ නම : ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 79
நிறுவனத்தின் பெயர்: இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் நிறுவனங்களிற்கும் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புகளும் மற்றும் தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Parliamentary Series No : 79
Name of the institution: Human Rights Commission of Sri Lanka
Submission of observations of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

රන්ජිත් උයන්ගොඩ
ලේකම්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පාර්ලිමේන්තු අනු අංකය : 79

ආයතනයේ නම : ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

වර්ෂය : 2022

| කමිටුව විසින් හඳුනා ගෙන ඇති අඩුපාඩු | අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග හා වර්තමාන තත්ත්වය |
|---|---|
| පළමු කොටස : 78.00 | |
| i. අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි | මානව හිමිකම් කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන තනතුර පුරප්පාඩුව පැවති බැවින්, අභ්‍යන්තර විගණනයක් සිදු කර නොමැත.<br>2023 වර්ෂයේදි එම පුරප්පාඩුව සඳහා නිලධාරියෙකු බඳවා ගත් අතර, දැනට පුහුණු කටයුතු සමඟ රාජකාරී ඉටු කිරීම සිදු කරනු ලබයි. |
| ii. අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත | මානව හිමිකම් කොමිෂන් සභාවේ 2022 වර්ෂයේදි අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවති බැවින්, අවදානම් ලේඛනයක් සකස් කර පවත්වාගෙන ගොස් නොමැත. මේ සඳහා පියවර ගෙන ඇත. |
| iii. සාමාජික ණය ලේඛනය (CC10) යාවත්කාලීනව පවත්වා නැත | මානව හිමිකම් කොමිෂන් සභාව දෙපාර්තමේන්තුවක් නොවන බැවින් ද, අර්ධ රාජ්‍ය ආයතනයක් බැවින් ද, රජයේ නිලධර අත්තිකාරම් "බී" ගිණුමක් නොමැති බැවින් සාමාජික ණය ලේඛනයක් (CC10) පවත්වාගෙන යනු නොලැබේ. භාණ්ඩාගාර අනුමැතිය ඇතිව නිලධාරීන්ගේ ආපදා ණය ගෙවීමට අරමුදලක් ලබා දී ඇත.<br>එම ණය වාරික වශයෙන් අයකර ගනු ලබයි. අයවන මුදල් වෙන වෙනම සටහන් පොතක පවත්වාගෙන යයි. ඒ ඒ මාසවල එකතු වන මුදලින් නැවත ගෙවීම සිදු කරයි. |
| iv. 2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාලරාමුව ඇතුළත මු.රෙ. 756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛන 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව තුල මු.රෙ.756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොමැති බව පිළිගනිමි. 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය 2024.06.27 දින ඉදිරිපත් කර ඇත. |

රන්ජිත් උයන්ගොඩ
ලේකම් (
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

| | |
|---|---|
| v. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ අතිරික්ත හෝ ඌනතා පිළිබඳ වාර්තා වී නොමැත. |
| vi. සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි | මානව හිමිකම් කොමිෂන් සභාවේ පවත්නා රහස්‍ය භාවය හා ආරක්ෂාව පදනම් කරගෙන කොමිෂන් සභා මාණ්ඩලික තීරණයක් මත රාජ්‍ය ලාංඡනය පින්තාරු නොකිරීමට ගෙන ඇති තීරණයක් ක්‍රියාත්මක කරනු ලබයි. |
| vii. මු.රෙ. 94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබුණි | බැරකම් ලේඛනය සකස් කර ඇත්තේ සිගාස් වැඩසටහන පදනම් කරගෙන ගිණුම් ගත කළ බැරකම් පමණක් උපයෝගී කර ගෙනය. මෙය නිවැරදි කර යාවත්කාලීන කර ඇත. |
| viii. වාර්ෂික කාර්යසාධන වාර්තාව නිසි පරිදි පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු ආරම්භ කර නොතිබුණි | වාර්ෂික කාර්‍යසාධන වාර්තාව වෙනුවට මානව හිමිකම් කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ වාර්ෂික වාර්තාව වන බැවින් 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව සකස් කර අවසන් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. |
| ix. මු.රෙ. 134(2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි | මු.රෙ: 134 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වැඩසටහන සකස් කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකුගේ පුරප්පාඩුව පැවතිණි. |
| x. සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි | 2022 වර්ෂයේ අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු පැවති බැවින් විගණන හා කළමණාකරන කමිටු රුැස්වීම් පවත්වා නැත. 2023 වර්ෂයේ අභ්‍යන්තර විගණකවරයා පත්කළ පසු පළමුවන රැස්වීම පවත්වන ලදී. |
| දෙවැනි කොටස : 42.00 | |
| i. ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි | වෙබ් අඩවියේ "අප අමතන්න" යටතේ අවස්ථාව සලසා දී ඇත. |
| ii. සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්යසාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි | කාර්යසාධන ගිවිසුම් සකස් කරමින් පවතී. |
| iii. ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි | ආයතනයේ විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනා ගනිමින් පවතී. වහාම සකස් කිරීමට පියවර ගනිමින් පවතී. |

රන්ජිත් උයන්ගොඩ
ලේකම් (
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

| | |
|---|---|
| iv. හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කරගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි | ආයතනයේ විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනා ගනිමින් පවතී. වහාම සකස් කිරීමට පියවර ගනිමින් පවතී. |
| v. හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි | ආයතනයේ විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනා ගනිමින් පවතී. වහාම සකස් කිරීමට පියවර ගනිමින් පවතී. |
| vi. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%කට වඩා අඩු මට්ටමක පැවතුණි | වියදම් කළමනාකරණ චක්‍රලේඛ වලට අනුකූලව අත්‍යවශ්‍ය පුහුණුවීම් පමණක් සිදු කරන ලදී. |
| vii. විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි | ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ මේ වනවිටත් ක්‍රියාත්මක කර ඇත. අනෙකුත් නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පියවර ගනිමින් සිටී. |
| viii. 2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි | මාණ්ඩලික තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත. |
| ix. උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි | කොමිෂන් සභාව අර්ධ රාජ්‍ය සේවා ගණයට වැටේ. ස්ථාන මාරුවීම් වලදී, දරුවන් පාසල් වලට ඇතුළත් කිරීම, නිල නිවාස පහසුකම් නොමැතිවීම ආදී රජයේ ස්ථානමාරු ප්‍රතිපත්තිය යටතේ ඇති පහසුකම් හා ප්‍රතිලාභ ලබාගත නොහැක. ඒ ඒ පළාත් වලට බඳවා ගැනීමේදී එම ප්‍රදේශයේ පදිංචිකරුවන්ට ප්‍රමුඛත්වය දී බඳවා ගැනීම හා සීමිත කාර්ය මණ්ඩලයක් පැවතීම තවත් හේතුවකි. |

රන්ජිත් උයන්ගොඩ
ලේකම් (
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව